
Australian Government

actnowstaysecure.gov.au




## ඔබ අන්තර්ජාලයේදී අවදානමට ලක්වන්නේ කුමකටද?

තාක්‍ෂණය වේගයෙන් දියුණු වන විට සහ අපි අන්තර්ජාලයේ වැඩි කාලයක් ගත කරන විට, ඕස්ට්‍රේලියානුවන් සයිබර් ප්‍රහාරයන්ට ගොදුරු වීමේ අවදානම දිගටම පවතී.

දැන්ම ක්‍රියාත්මකවන්න. ආරක්ෂිතව සිටින්න. මෙම ව්‍යාපාරය ඕස්ට්‍රේලියානුවන් අන්තර් ජාලය හරහා තමන්ව ආරක්ෂා කර ගැනීමට සෑම කෙනෙකුටම ගත හැකි සරල සයිබර් ආරක්ෂිත ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කරයි.

**දැන්ම ක්‍රියාත්මකවන්න. ආරක්ෂිතව සිටින්න.**

## මාර්ගගතව ආරක්ෂිත වන්නේ කෙසේද?

### සෑම ගිණුමක් සඳහාම අද්විතීය සහ ශක්තිමත් වාක්‍ය මුරපදයක් භාවිතා කරන්න.

ඔබගේ සෑම සබැඳි ගිණුමක් සඳහාම අනන්‍ය සහ ශක්තිමත් වාක්‍ය මුරපදයක් භාවිතා කිරීම, සබැඳිව ආරක්ෂිතව සිටීමට ඔබට ගත හැකි වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගවලින් එකකි.

වාක්‍ය මුරපදයක් යනු වඩාත් ආරක්ෂිත මුරපදයකි. එහි අහඹු වචන අනුපිළිවෙලක් අඩංගු වේ. ඒවා ඔබට මතක තබා ගැනීමට පහසු නමුත් සයිබර් අපරාධකරුවන්ට අනුමාන කිරීමට අපහසුය.

ඔබේ වාක්‍ය මුරපද ශක්තිමත් සහ අද්විතීය වීමට :

- ✓ අහඹු වචන හතරක් හෝ වැඩි ගණනක් තබාගන්න
- ✓ අක්ෂර 15ක් හෝ වැඩි ගණනක් අඩංගු කරන්න
- ✓ සෑම ගිණුමකටම වෙනස්වන ආකාරයෙන්
- ✓ පවුලේ නම්, උපන්දින හෝ ලිපින වැනි හඳුනාගත හැකි තොරතුරු ඇතුළත් නොකරන්න
- ✓ වෙබ් අඩවිය හෝ සේවාව මගින් අවශ්‍ය නම්, සංකේත, ලොකු අකුරු හෝ අංක ඇතුළත් කරන්න.

ඔබේ අද්විතීය වාක්‍ය මුරපද නිර්මාණය කිරීම සහ ගබඩා කිරීම සඳහා මුරපද කළමනාකරුවෙකු භාවිතා කිරීම සලකා බලන්න.

### ඔබගේ උපාංග ආරක්ෂිතව තබා ගැනීමට සියලුම මෘදුකාංග යාවත්කාලීන කිරීම් ස්ථාපනය කරන්න.

අන්තර්ජාලයට සම්බන්ධ ඔබගේ සියලුම උපාංග (ඔබගේ දුරකථනය, ලැප්ටොප් හෝ ස්මාට් ඔරලෝසුව වැනි) සඳහා සැමවිටම මෘදුකාංග යාවත්කාලීන කිරීම් ස්ථාපනය කිරීම ඔබේ මාර්ගගත සබැඳියාව ආරක්ෂිතව තබා ගැනීම සඳහා ඉතා වැදගත් වේ.

මෘදුකාංග යාවත්කාලීන කිරීම් ඔබගේ උපාංගවල ආරක්ෂාවේ දුර්වලතා හෝ හිඩැස් නිවැරදි කරයි. නිතිපතා යාවත්කාලීන කිරීම් ස්ථාපනය කිරීම ඔබගේ උපාංග ආරක්ෂිතව තබා ගන්නා අතර සයිබර් අපරාධකරුවන්ට ඒවාට ප්‍රවේශ වීම දුෂ්කර කරයි.


ස්වයංක්‍රීය යාවත්කාලීන ක්‍රියාත්මක කිරීමට විමසූ විට ඒවා ස්ථාපනය කිරීමට වග බලා ගන්න.

### සෑම විටම බහු-සාධක සත්‍යාපනය සකසන්න

ඔබගේ සියලුම සබැඳි ගිණුම් වලට අමතර ආරක්ෂිත ස්ථරයක් එක් කිරීමට බහු-සාධක සත්‍යාපනය ලබා ගත හැකි තැන්වල ක්‍රියාත්මක කරන්න.

බහු-සාධක සත්‍යාපනයට ඔබගේ ගිණුමට පිවිසීමට සත්‍යාපන ක්‍රම දෙකක් හෝ වැඩි ගණනක් අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස, ඔබගේ මුරපදය හෝ වාක්‍ය මුරපදය ඇතුළත් කිරීමෙන් පසු, සත්‍යාපන යෙදුමක්, විද්‍යුත් තැපෑලක් හෝ කෙටි පණිවුඩයක් හරහා ඔබට එවන ලද කේතයක් ඇතුළත් කිරීම වැනි දෙවන සත්‍යාපනයක් ලබා දීමට ඔබෙන් විමසනු ඇත.

ඔබගේ වෙනත් සත්‍යාපන ක්‍රමවලින් එකක් (වාක්‍ය මුරපදයක් වැනි) අවදානමට ලක් වුවද, බහු-සාධක සත්‍යාපනය ඔබගේ ගිණුම ආරක්ෂා කරයි.




## අන්තර්ජාලයේ ආරක්ෂිත වීමට තවත් ක්‍රම අවශ්‍යද?

සයිබර් ආරක්ෂිතව සිටීමට තවත් ක්‍රම සොයනවාද? අන්තර්ජාලය හරහා ඔබව ආරක්ෂා කර ගැනීමට ඔබට ගත හැකි තවත් ක්‍රියාමාර්ග කිහිපයක් මෙන්න.

### පොදු Wi-Fi සේවා භාවිතා කරන විට ප්‍රවේශම් වන්න.

පොදු Wi-Fi සේවා භාවිතා කරන විට, සම්බන්ධතාවය ආරක්ෂිත නොවන බැවින් කිසිදු සංවේදී හෝ පෞද්ගලික තොරතුරකට ප්‍රවේශ නොවන්න. මෙයට ඔබේ සමාජ මාධ්‍ය, විද්‍යුත් තැපෑල හෝ මාර්ගගත බැංකුකරණය ඇතුළත් වේ. ඔබ ඇතුළු කරන යම්කිසි තොරතුරක් සයිබර් අපරාධකරුවන්ට ප්‍රවේශ විය හැකිය.

### ඔබේ පෞද්ගලිකත්වය සහ ස්ථාන සැකසුම් නිතිපතා පරීක්ෂාකර යාවත්කාලීන කරන්න.

ඔබ ගැන පුද්ගලික හෝ හඳුනාගැනීමේ තොරතුරු අහම්බෙන් මහජනයා සමඟ බෙදා නොගන්නා බවට වග බලා ගැනීම සඳහා ඔබේ පෞද්ගලිකත්වය සහ ස්ථාන සැකසුම් නිතර පරීක්ෂා කිරීම වැදගත් වේ.

පරීක්ෂා කළ යුතු සැකසුම් අතරට ඔබේ සමාජ මාධ්‍ය ගිණුම්වල රහස්‍යතා සැකසුම් සහ ඔබේ යෙදුම් සහ උපාංගවල භූ ස්ථානගත කිරීමේ ලුහුබැඳීම ඇතුළත් වේ.

### මිතුරන් සහ පවුලේ අය සමඟ සයිබර් ආරක්ෂිතව සිටින්නේ කෙසේද යන්න ගැන කතා කරන්න.

ඔබ, ඔබේ පවුලේ අය සහ මිතුරන් අන්තර්ජාලය තුළ ආරක්ෂිතව තබා ගැනීම සඳහා අධ්‍යාපනය සහ දැනුවත්භාවය ඉතා වැදගත් වේ – විශේෂයෙන් ඔබ අන්තර්ජාලයට සම්බන්ධ උපාංග බෙදා ගන්නේ නම්. ඔබේ ජාලය සමඟ ඒ ගැන කතා කිරීම සයිබර් ආරක්ෂාව ප්‍රමුඛස්ථානයේ තබා ගන්නා අතර අන්තර්ජාලය හරහා තමන්ව ආරක්ෂා කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ නවතම තොරතුරු ඔවුන්ට ලැබෙන බව සහතික කරයි.

### වංචාවක් හඳුනා ගන්නේ කෙසේදැයි ඉගෙන ගන්න

වංචාකරුවන් මුදල් ගෙවීමට හෝ ඔවුන්ගේ පුද්ගලික තොරතුරු ලබා දීමට මිනිසුන් රවටා ගනිති.

ඔබ ගනුදෙනු කරන්නේ කා සමඟද යන්න ඔබට නිශ්චිත නැතිනම් කිසි විටෙකත් කිසිවෙකුට මුදල් හෝ පුද්ගලික තොරතුරු ලබා නොදෙන්න. නිල වෙබ් අඩවියකින් හෝ යෙදුමකින් ඔබ සොයා ගන්නා තොරතුරු භාවිතා කර පුද්ගලයා හෝ සංවිධානය සම්බන්ධ කර ගැනීමෙන් පරීක්ෂා කරන්න.

### සයිබර් ප්‍රහාර සහ සිදුවීම් වාර්තා කරන්න

රජයට නව ප්‍රවණතා හඳුනා ගැනීමට, ප්‍රජාව දැනුවත් කිරීමට සහ සයිබර් සිද්ධියෙන් මිදීමට ඔබට සහාය වීමට වංචා හෝ සයිබර් සිදුවීම් වාර්තා කිරීම ඉතා වැදගත් වේ.

actnowstaysecure.gov.au වෙබ් අඩවියෙන් ඔබව ආරක්ෂා කර ගැනීමට සරල පියවර ඉගෙන ගන්න.

දැන්ම ක්‍රියාත්මක වන්න.
ආරක්ෂිතව සිටින්න.
actnowstaysecure.gov.au